ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
உள்நாட்டு தொழிற்பாடுகள் திணைக்களம்
Domestic Operations Department

2020 ජුනි 18

**මෙහෙයුම් උපදෙස් අංක : 35/03/023/0001/001**

**සියලුම සහභාගිත්ව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත,**

**රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු/ඇපකර මත ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා දෙනු ලබන ද්‍රවශීලතා පහසුකම**

**1. හැඳින්වීම**

1.1 කොරෝනා (කෝවිඩ් 19) වසංගතයේ බලපෑමට ලක්වූ ඉදිකිරීම් ක්ෂේත්‍රය නැවත පණගැන්වීම ජාතික අවශ්‍යතාවක් ලෙස හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රජයේ උපදෙස්වලට අනුකූලව මූල්‍ය අංශය සඳහා සහන සැලසීමට ක්‍රියාමාර්ග රාශියක් හඳුන්වා දෙන ලදී.

1.2 ඒ අනුව, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සහනදායී පොලී අනුපාතිකයකට, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඉදිරිපත් කරන පොරොන්දු නෝට්ටුවක් මත දින 180 ක කාලයක් දක්වා එම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත කඩිනම් ද්‍රවශීලතා පහසුකමක් ලබාදීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

1.3 කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් අහිතකර බලපෑමට ලක්වූ ඉදිකිරීම් ක්ෂේත්‍රය වෙත රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු/ඇපකර මත ණය පහසුකම් ලබාදීමේ අරමුණින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මෙම මෙහෙයුම් උපදෙස් නිකුත් කරනු ලැබේ.

1.4 ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදු කරන ලද කොන්ත්‍රාත් කටයුතු වෙනුවෙන් නොපියවූ ගෙවීම් හේතුවෙන් පැනනැගී ඇති අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා වන ද්‍රවශීලතා ආධාරක පහසුකමක් ලෙස මෙම පහසුකම ක්‍රියාත්මක වනු ඇත.

**2. ද්‍රවශීලතා පහසුකමෙහි මූලික අංග**

2.1 2020 ජුනි මස 18 දින සිට නැවත දැනුම් දෙන තුරු මෙම මෙහෙයුම් උපදෙස් බලපැවැත්වෙනු ඇත.

2.2 මුදල් නීති පනතේ 83(1) (සී) (ii) කොටස යටතේ 83(2) කොටසෙහි අවශ්‍යතාවන්ට යටත්ව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන වෙත රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු/ඇපකර මත බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුවක් මහ බැංකුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සියයට 1 ක සහනදායී වාර්ෂික පොලී අනුපාතිකයකට වාණිජ බැංකුවලට දින 180 ක කාලසීමාවක් දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය පහසුකම ලබාදෙනු ලබයි. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් එවැනි නව පොරොන්දු නෝට්ටු ඉදිරිපත් කිරීම මත නැවත නව ණය පහසුකම් ලබාදීමට අවස්ථාව ලැබේ.

7 වන මහල, 2 වන කුළුණ
අංක 30, ජනාධිපති මාවත
තැ.පෙ. 590, කොළඹ 01, ශ්‍රී ලංකාව

தளம் 7, கோபுரம் 2
இல. 30, சனாதிபதி மாவத்தை
த.பெ 590, கொழும்பு 01, இலங்கை

Level 7, Tower 2
No. 30, Janadhipathi Mawata
P.O. Box 590, Colombo 01, Sri Lanka

+94 112 477036 +94 112 346287 ddod@cbsl.lk www.cbsl.gov.lk

2.3 බලපත්‍රලාභී වාණිජ බැංකු මෙම පහසුකම ලබාගැනීම සඳහා රජයෙන් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු/ඇපකර මත ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන විසින් ලබාගන්නා ලද ණය පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබීමට සැලැස්විය යුතුය. ඇමුණුම් අංක I පරිදි, නිවැරදිව සම්පූර්ණ කරන ලද ලේඛනයෙහි බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි බලයලත් නිලධාරීන් විසින් අත්සන් කළ දෘඪ පිටපත (Hard Copy) අධ්‍යක්ෂ, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. ඇමුණුම් අංක I හි මෘදු පිටපත (Soft Copy) එම අවස්ථාවේදීම අදාළ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කළ යුතුය. වාණිජ බැංකු විසින් ඇමුණුම් අංක I හි සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාව සහ අනුකූලතාව තහවුරු කළ යුතුය.

2.4 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඉදිරිපත් කරනු ලබන ඇමුණුම් අංක II හි දැක්වෙන පරිදි අදාළ පොරොන්දු නෝට්ටු සමඟ ඇමුණුම් අංක I ලැබීමෙන් පසු, අධ්‍යක්ෂ, දේශීය මෙහෙයුම් කටයුතු විසින්, පොරොන්දු නෝට්ටුවේ මුහුණත වටිනාකමින් සියයට 99 ක් නොඉක්මවන මුදලක් අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි පියවීම් ගිණුම වෙත බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.

2.5 මෙම පහසුකම මත බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත සියයට 3 ක් නොඉක්මවන පොලී ආන්තිකයක් පවත්වා ගෙන යා හැකි අතර, එමගින් මෙම ණය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන සඳහා සියයට 4 ක් නොඉක්මවන වාර්ෂික පොලී අනුපාතිකයකට ණය ලබාගත හැකි විය යුතුය.

2.6 ඇප වශයෙන් තබන ලද පොරොන්දු නෝට්ටු/ඇපකර කල්පිරෙන දිනයේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, ලබාදෙන ලද මුදල සහ ඊට අදාළ පොලී ප්‍රමාණය තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි ඇති අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි පියවීම් ගිණුමෙන් හර කර ගනු ලැබේ.

2.7 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරියට යෙදී ඇති කල්පිරීම් සම්බන්ධ තොරතුරු පොරොන්දු නෝට්ටු/ඇපකර කල්පිරීමට සති දෙකක කාලයකට පෙර, අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දැනුම් දෙනු ලැබේ.

2.8 ඇප වශයෙන් තබන ලද පොරොන්දු නෝට්ටු/ඇපකර රජය විසින් නියමිත පරිදි ගෙවූ අවස්ථාවකදී, බලපත්‍රලාභී වාණිජ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ පියවීම කඩිනමින් සිදු කළ යුතුය.

2.9 මෙම මෙහෙයුම් උපදෙස් යටතේ ලබාගත් අරමුදල්වල භාවිතය පිළිබඳ තොරතුරු වාර්තාවක් දෙසතියකට වරක් ඇමුණුම් අංක II පරිදි, සෑම මසකම 15 වන දින සහ 30 වන දිනෙන් පසුව එළඹෙන වැඩ කරන දින 3 ක් ඇතුළත, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

2.10 බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මෙම පහසුකම ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කරනු ලබයි.

**සී.ජේ. අබේසිංහ**
**අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු**

ඇමුණුම I

මෙහෙයුම් උපදෙස් අංක: 35/03/023/0001/001

**රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු/ඇපකර මත ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම**

**බැංකුවේ නම:**

| | කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම් කරන ලද ණය පිළිබඳ තොරතුරු | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | බැංකුව විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව | | | | | රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව/ඇපකර | | | |
| | යොමු අංකය (ඇමුණුම II පරිදි) | නිකුත් කළ දිනය | කල්පිරෙන දිනය | වටිනාකම (රු.) | මහ බැංකුවෙන් ඉල්ලුම් කරන ලද ප්‍රමාණය (රු.) | යොමු අංකය | කොන්ත්‍රාත්කරුගේ නම | වටිනාකම | නිකුත් කළ දිනය |
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |
| 3 | | | | | | | | | |
| 4 | | | | | | | | | |
| 5 | | | | | | | | | |

.................................... ....................................... ........................................

දිනය පරීක්ෂා කළේ අනුමත කළේ

**මෙම තොරතුරු විද්‍යුත් තැපැල හරහා dod@cbsl.lk වෙත යොමු කළ යුතුය.**

ඇමුණුම II

පොරොන්දු නෝට්ටු අංකය:

.................................................................

(බැංකුව විසින් නිකුත් කරන ලද)

**පොරොන්දු නෝට්ටුව**

කොළඹ

දිනය: 2020/      /

රු. ..................................

.............................................................. **(සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය)**, රුපියල් ..........................................

(රු. .....................) මුදලක් මෙහි දාතමයේ සිට දින 180 කින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට හෝ එහි අණට වාර්ෂිකව සියයට 1 ක ප්‍රතිශතයක් (1%) වූ පොලිය සමඟ ගෙවීමට පොරොන්දු වේ.

සහභාගිත්ව මූල්‍ය ආයතයේ නම

මුද්දර

බලයලත් නිලධාරියාගේ අත්සන සහ නිල මුදාව

**සාක්ෂිකරුවන්: 1.** ..............................
**2.** ..............................

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
මහ බැංකුවේ යොමු අංකය:
කල්පිරෙන දිනය:
පොලිය සමඟ මුළු මුදල (රු):

ඇමුණුම III

මෙහෙයුම් උපදෙස් අංක: 35/03/023/0001/001

**රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු/ඇපකර මත ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම**

**බැංකුවේ නම:**

| | ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම භාවිතය පිළිබඳ දෙසති වාර්තාව | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | බැංකුව විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව | | | රජය විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුව/ඇපකර | | | | | |
| | යොමු අංකය (ඇමුණුම II පරිදි) | කල්පිරෙන දිනය | දෙන ලද ණය මුදල (රු.) | යොමු අංකය | කොන්ත්‍රාත්කරුගේ නම | මුහුණත වටිනාකම (රු.) | නිකුත් කළ දිනය | කල්පිරෙන දිනය | 2020 ........ දිනට නොපියවූ ණය ප්‍රමාණය |
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |
| 3 | | | | | | | | | |
| 4 | | | | | | | | | |
| 5 | | | | | | | | | |

| ................................... | ................................... | ................................... |
|---|---|---|
| දිනය | පරීක්ෂා කළේ | අනුමත කළේ |

මෙම තොරතුරු විද්‍යුත් තැපැල හරහා dod@cbsl.lk වෙත යොමු කළ යුතුය.